සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2022

11 ශ්‍රේණිය | **කතෝලික ධර්මය I** | කාලය පැය 1 යි

නම/ විභාග අංකයඃ

- සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.

---

01 ''එක් පොතක් නොව පොත් සමූහයකින් යුත් පුස්තකාලයක්'' ලෙස හැඳින්වෙන්නේ,
(1) ජීවන සහා සම්ප්‍රදායයි. (2) පුරාණ ගිවිසුමයි.
(3) ශුද්ධ බයිබලයයි. (4) ශුද්ධ බයිබලයයි.

02 මිනිස් ඉතිහාසය තුළ ක්‍රියාකරන දෙවියන්වහන්සේ වඩාත් ප්‍රබලව හඳුනාගත හැක්කේ පුරාණ ගිවිසුමේ,
(1) පංච පුස්තකය ඇසුරෙනි. (2) ඉතිහාස පොත් ඇසුරෙනි.
(3) දිවැසි පොත් ඇසුරෙනි. (4) ප්‍රඥා පොත් ඇසුරෙනි.

03 ග්‍රීසියේ අක්කායාහි දී රචනා කරන්නට ඇතැයි සැළකෙන නව ගිවිසුමට අයත් කෘතිය වූයේ,
(1) මාක් සුභාරංචියයි. (2) මතෙව් සුභාරංචියයි.
(3) ලූක් සුභාරංචියයි. (4) අපොස්තුළුවරුන්ගේ ක්‍රියා පොතයි.

04 කතන්දර ස්වරූපයකින් ඉදිරිපත් කර ඇති ප්‍රඥා සාහිත්‍ය ග්‍රන්ථය වන්නේ,
(1) ප්‍රඥාව (2) ජෝබ් (3) සිරාක් (4) ගීතාවලිය

05 දෙවියන්වහන්සේ විසින් පොරොන්දු වූ ගැලවීම මානව සංහතියට හිමි වූයේ ජේසුස් වහන්සේගේ
(1) උකුත්වීමෙන් දින තුනකට පසුය. (2) උත්ථානයෙන් දින තුනකට පසුය.
(3) ස්වර්ගාරෝහණයෙන් දින තුනකට පසුය. (4) ශුද්ධාත්ම ආගමනයෙන් දින තුනකට පසුය.

06 පාස්කු ඉරිදාවේ උත්ථාන වූ ජේසුස් වහන්සේ ගැන ශුද්ධ ලියැවිල්ලේ සඳහන් ව තිබූ දෑ දැනගැනීමට භාග්‍ය ලැබුවේ,
(1) ජෙරුසලමේ රැඳී සිටි ශ්‍රාවකයන් ය.
(2) ගල්ලෙන වෙත සුවඳ ද්‍රව්‍ය රැගෙන ගිය මරිය මග්දලේනා ය.
(3) දින 8 ක ට පසු දර්ශනය ලද තෝමස් ය.
(4) එම්මාවුස් බලා ගිය ශ්‍රාවකයන් ය.

07 දෙවන ධර්මදූත චාරිකාව ආරම්භයේ දී පාවුළු තුමා සමග එක්වූ සහකාර ධර්මදූතයෙකි,
(1) ජොහාන් මාක් (2) සීලස් (3) තිමෝතියස් (4) ලූක්

08 ශුද්ධ වූ සභාව .................................... යෙදෙමින් සභාවේ විශ්වීය බව ව්‍යාප්ත කරයි. හිස් තැනට සුදුසු පිළිතුර වන්නේ,
(1) ධර්මදූත සේවයේ (2) ධර්මෝපදේශයේ
(3) අපෝස්තලික සේවයේ (4) ධර්මදානයේ


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

09 පීඩන සමයක සිරිලක කිතුණුවන් වෙනුවෙන් සේවය කළ පූජක නිකාය වන්නේ,

(1) ඔරතෝරියානු නිකාය (2) ප්‍රැන්සිස්කන් නිකාය

(3) ජේසු නිකාය (4) නිමල මරිය නිකාය

10 පහත දැක්වෙන ප්‍රකාශන අතරෙන් ජුසේවාස් පියතුමාට අදාළ වන ප්‍රකාශන ඇතුළත් වරණය වන්නේ,

A මෙහෙකරුවෙකු මෙන් වෙස්වලාගෙන මන්නාරමට පැමිණීම.

B දේශීය කිතුණු සාහිත්‍යය ගොඩනැගීමට පුරෝගාමී වීම.

C තම පූජක දිවියෙන් වසර 30 ක් ම ලංකාවේ සේවය කිරීම.

D 2 වැනි ජුවාම් පාවුළු සුදොතුම් පියා විසින් භාග්‍යවරයට ඔසවනු ලැබීම.

(1) AB (2) BC (3) AC (4) AD

11 ජේසුස් වහන්සේ මහ බ්‍රහස්පතින්දා සිදුකළ පාද දෝවන ක්‍රියාවේ යථාර්ථය වන්නේ,

(1) දිව්‍ය පූජාවට අර්ථයක් දීමය. (2) ප්‍රේමයේ හා සේවයේ දිවියක් ගත කිරීමය.

(3) ශ්‍රාවකයන් වෙත ප්‍රේමය දැක්වීමය. (4) සිය ජීවිත යාගය පරිපූර්ණ කිරීමය.

12 අවසන් විනිශ්චයේ දී ඒ සඳහා යොදාගන්නා මිණුම් දණ්ඩ ලෙස මතෙව් සුපුවතේ දක්වා ඇත්තේ,

(1) ශාරීරික පුණ්‍ය ක්‍රියාය. (2) ආත්මික පුණ්‍ය ක්‍රියාය.

(3) දසපණත ඉටුකිරීමය. (4) භාග්‍ය අට තුළ දිවි ගෙවීමය.

13 ''මම පූජාවලට වඩා කරුණාවට කැමැත්තෙමි.'' යනුවෙන් සඳහන් ග්‍රන්ථය වන්නේ,

(1) යෙසායා (2) ජෙරමියා (3) හොසියා (4) ආමොස්

14 මර්යදාව සුරකින්නා,

(1) සාධාරණව වස්තු උපයයි. (2) යුක්තිය ඉටුකිරීමට පෙළඹෙයි.

(3) දෙමාපිය වැඩිහිටියන්ට ගරුකරයි. (4) ආත්ම දමනය තුළ ක්‍රියා කරයි.

15 හිතෝපදේශයට අනුව දරුවන්හට දී ඇති අවවාදය නම්,

(1) ''මාගේ පුත්‍රය, පියාගේ අවවාදය අසන්න. මවගේ උපදෙස් ඉවත නොදමන්න.''

(2) ''දරුවනි සියලු කාරණාවලදී මව්පියන්ට කීකරුවන්න.''

(3) ''ඔබේ පියාටත්, මවටත් ගෞරව කරන්න. ඈ විඳි ප්‍රසව වේදනාව අමතක නොකරන්න.''

(4) ''තම පියාට ගෞරව කරන්නාට දීර්ඝායු ලැබෙන්නේය.''

16 ''මගේ ............................... සැදෙන විට මව් කුසෙහි මා වැඩෙන විට ........................................... මා තැනෙන විට මා එහි වූ බව ඔබ දැන සිටි සේක.''

මෙහි හිස්තැන් සඳහා අදාළ පිළිතුර වන්නේ,

(1) දුර්වල / රහසිගතව (2) ඇටකටු / රහසිගතව

(3) ඇටකටු / නිර්භීතව (4) නිර්භීතව / රහසිගතව

17 විශ්වාසයේ සත්‍යතා සඳහා දෙනු ලබන උතුම්ම සාක්ෂිය ලෙස පෙන්වා දෙන්නේ,

(1) සාක්ෂි දැරීමය. (2) වේද සත්‍යතා ප්‍රකාශ කිරීමය.

(3) ප්‍රාණපරිත්‍යාග වීමය. (4) ප්‍රාතිහාර්ය පෑමය.

18 අනුන් නොමග යවන කතා කීමෙන් කඩ වන්නේ,

(1) දෙවැනි පණත ය. (2) සිව්වැනි පණත ය. (3) හත්වැනි පණත ය. (4) අටවැනි පණත ය.

19 ජනවන්දනා වර්ෂය තුළ <u>චතාරික හා පාස්කු</u> සමයයන්හි දී කියවනු ලබන්නේ,

(1) ලූක් සුපුවත ය. (2) ජොහාන් සුපුවත ය.

(3) මාක් සුපුවත ය. (4) මතෙව් සුපුවත ය.

20 ජනවන්දනාව තුළ භාවිත වන සුදු වර්ණයෙන් අර්ථවත් වන්නේ,

(1) බලාපොරොත්තුව හා නව ජීවනය (2) ඇදහිල්ලට සාක්ෂි දැරීම
(3) මහිමාන්විත බව හා ශුද්ධවත් බව (4) බලාපොරොත්තුව හා ආනන්දය

21 ඊශ්‍රායෙල් ජනතාවගේ කාන්තාරයේ ගමන විස්තර කෙරෙන පංච පුස්තකයට අයත් ග්‍රන්ථය වන්නේ,

(1) උත්පත්ති (2) නික්මයාම (3) ගණන් කතාව (4) ලෙවී ව්‍යවස්ථාව

22 ගැඹුරු ඇදහිල්ලකින් හා උදාර චින්තන ශක්තියකින් හෙබි දිවැසිවරයා වන්නේ,

(1) යෙසායා (2) ජෙරමියා (3) එසකියෙල් (4) ආමොස්

23 ලේඛක දිවැසි නාම පමණක් ඇති වරණය තෝරන්න.

(1) යෙසායා, ජෙරමියා, නාතාන් (2) හොසියා, හුල්දා, නාහුම්
(3) ජෝනා, මීකා, එළියා (4) හබක්කුක්, සෙකරියා, මලාකි

24 ශුභාරංචි කතුවරුන් පිළිබඳ ප්‍රකාශ කීපයක් පහත දැක්වේ.

A ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් 12 දෙනාගෙන් අයෙකි.

B පේදුරුතුමාගේ භාෂා පරිවර්තකයා ය.

C ජේසුස් වහන්සේ අදහා ගැනීමෙන් ජීවනය ලැබෙන බව පෙන්වා දෙයි.

D ස්නාවක ජොහාන් තුමා පාළුකරයේ කළ දේශනාවෙන් සිය ශුභාරංචිය අරඹයි.

මේවා අතරින් මාක්තුමාට පමණක් අදාළ කරුණු දැක්වෙන වරණය වන්නේ,

(1) A හා C (2) A හා D (3) B හා C (4) B හා D

25 උත්පත්ති 3 : 15 ශුද්ධවූ ලියැවිලි පාඨයෙන් පෙන්වා දෙන, දෙවියන් වහන්සේගේ ගුණාංග වන්නේ,

(1) ප්‍රේමය හා කරුණාව (2) ප්‍රේමය හා මහිමය
(3) ප්‍රේමය හා බලය (4) ප්‍රේමය හා ආරක්ෂාව

26 මිනිසා විසින් මෙලොව වර්ධනය කළ පාපය ඉවත් කර නව ලොවක ආරම්භය සනිටුහන් කළ කතා පුවත වන්නේ,

(1) නික්මයාමය (2) නෝවා හා ජල ගැල්මය
(3) බාබෙල් කොතය (4) දස පණත දීමය

27 ස්නාවක ජොහාන් තුමා පිළිබඳව දිවැසිවර මලාකි විසින් ප්‍රකාශිත දිවැසි වැකිය වන්නේ,

(1) ''මට පෙරටුව ගොස් මාගේ මාර්ගය පිළියෙල කරන්නාවූ මාගේ දූතයා මම එවන්නෙමි.''
(2) ''ඔහු ස්වාමින් වහන්සේ අභිමුවෙහි ශ්‍රේෂ්ඨ වන්නේ ය.''
(3) ''ඔහු ඊශ්‍රායෙල්වරු බොහෝ දෙනෙකු ස්වාමින් වහන්සේ වෙත හරවන්නේ ය.''
(4) ''මව්කුස සිටම ඔහු ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වන්නේ ය.''

28 ගැලවීම ලබාගැනීමට නම් සැබෑ සිත් හැරීමක් අවශ්‍යම බව ස්නාවක ජොහාන්තුමා අවධාරණය කළේ,

(1) සාමාන්‍ය පොදු ජනතාවට ය. (2) ඊශ්‍රායෙල් ප්‍රභූ සමාජයට ය.
(3) අය බදු නිලධාරීන්ට ය. (4) හමුදා සෙබළුන්ට ය.

29 මෙම පිළිතුරු අතරින් පශ්චත්තාපී ක්‍රියාවක් වන්නේ,

(1) නිරාහාරශීලය රැකීම. (2) භාවනා කිරීම.
(3) ශුද්ධවූ පැය පැවැත්වීම. (4) වගකීම් නිසි පරිදි ඉටුකිරීම.

30 කිතුණු විවාහයේ බාහිර සළකුණ ලෙස සැළකෙන්නේ,

(1) මංගල මුදුව (2) විවාහ පොරොන්දුව
(3) විවාහය ලියාපදිංචි කිරීම (4) මංගල දිව්‍ය පූජාව

31 පැවිදි දිවියේ විශේෂ ලක්ෂණයකි,

(1) ධාර්මික ජීවිතය (2) දේව ජීවිතය

(3) ඇදහිල්ලේ ජීවිතය (4) සේවයේ ජීවිතය

32 ෆ්‍රෑන්ක් ඩෆ් මහතා විසින් ආරම්භ කළ ගිහි දූත සේවාව වන්නේ,

(1) මරිය හමුදාව (2) තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය

(3) වින්සන්ද පාවුලා සමිතිය (4) කතෝලික දහම් පාසල

33 මිනිසා දේව මැවිල්ල සංරක්ෂණය කළයුතු බව පෙන්වා දීම සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනය නම්,

(1) අබාද් ය. (2) ආපාර් ය. (3) ෂමාර් ය. (4) ටෝරා ය.

34 ඇතුළාන්ත සාමයට මූලික වන ගුණයකි,

(1) දයාව (2) එකමුතුකම (3) සමගිය (4) නිදහස

35 ශාරීරික පුණ්‍ය ක්‍රියාවල යෙදීමෙන් අපේක්ෂා කළ යුත්තේ,

(1) මූලික මිනිස් අවශ්‍යතා ඉටුකිරීමට දායක වීම ය.

(2) සදාතන ජීවිතය අත්පත් කර ගැනීම ය.

(3) සමාජ සාධාරණත්වය ඉටුකිරීම ය.

(4) පින් කුසල් රැස්කර ගැනීම ය.

36 දේව දරුවන් ලෙස ජීවත් වීමට දේව පණත්, ශු. සභාවේ නීති හා .................................... මඟ පෙන්වයි. හිස්තැනට අදාළ පිළිතුර තෝරන්න.

(1) සම්ප්‍රදායන් (2) අණ පණත් (3) ශික්ෂා පද (4) නියෝග

37 දෙව් මිනිස් සංවාදය සඳහා කිතු සමිඳුන් අපට ලබාදුන් පරමාදර්ශය වන්නේ,

(1) උදය ආරාධනාව (2) ස්වාමිවාක් ආරාධනාව

(3) විශ්වාස ලක්ෂණය (4) දේව දූත මංගලම්

38 මරියතුමිය ජන්ම දෝෂයෙන් නිර්දෝෂව පිළිසිඳ ගැනීම, ප්‍රකාශයට පත් කළ ශුද්ධෝත්තම පියතුමා වන්නේ,

(1) අති උතුම් V වැනි පියුස් ශුද්ධෝත්තම පියතුමා

(2) අති උතුම් VII වන පියුස් ශුද්ධෝත්තම පියතුමා

(3) අති උතුම් IX වන පියුස් ශුද්ධෝත්තම පියතුමා

(4) අති උතුම් XII වන පියුස් ශුද්ධෝත්තම පියතුමා

39 සැඳෑ යාම යැදුමේ දී යොදාගන්නා ප්‍රශංසා ගීතිකාව වන්නේ,

(1) සෙකරියස්තුමාගේ ප්‍රශංසා ගී ය. (2) සිමියොන්තුමාගේ ප්‍රශංසා ගී ය.

(3) මරියතුමියගේ උදාන ගී ය. (4) දේව දූත ප්‍රශංසා ගී ය.

40 කිතුණු අපට භාවනාව සඳහා යෝග්‍යතම මූලාශ්‍රය වන්නේ,

(1) ජපමාලයයි. (2) ශුද්ධ බයිබලයයි. (3) මුනිවර බැතියයි. (4) ගීතාවලියේ ගීතයි.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2022

11 ශ්‍රේණිය **කතෝලික ධර්මය II** කාලය පැය 2 යි

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරාගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

01. (i) නව ගිවිසුමේ හසුන් පත් අතර ඇති සාමාන්‍ය හසුන් දෙකක් නම් කරන්න.

(ii) මුල් කිතුණු සභාව තුළ සුබ අස්න දේශනා කිරීම හා සහනාධාර බෙදාදීම යන කාර්යයන් පැවරුන කණ්ඩායම් දෙක නම් කරන්න.

(iii) මැක්ෂිමිලියම් කෝල්බේ පියතුමා රචනා කළ සඟරාව හා ලිපිය නම් කරන්න.

(iv) පෞද්ගලික දේපළ පරිහරණය කළ යුතු ආකාරය ගැන උගන්වන පණිත් දෙක නම් කරන්න.

(v) ලාඕස් හා එර්ගොන් යන ග්‍රීක වචනවල අර්ථ ලියන්න.

(vi) ද්විතීය සම්මත ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(vii) ආබ්‍රහම්තුමාට දෙවියන් වහන්සේ දුන් පොරොන්දු දෙක ලියන්න.

(viii) පදවි පූජක පොරොන්දු දෙක ලියන්න.

(ix) තාපස දිවියේ පුරෝගාමීන් දෙදෙනෙකු නම් කරන්න.

(x) යාම යැදුම් සඳහා භාවිත කෙරෙන ප්‍රශංසා ගීත දෙකක් දක්වන්න.

(ලකුණු $2 \times 10 = 20$)

02. (i) ලෙවී ව්‍යවස්ථාව හා විලාප ගී යන ග්‍රන්ථ ඇතුළත් පොත් කාණ්ඩ දෙක පිළිවෙළින් දක්වන්න.

(ii) ශුද්ධාත්ම ආගමනයෙන් ඔද වැඩුන අපෝස්තුළුවරු සුබ අස්න දේශනා කිරීම ආරම්භ කළ ප්‍රදේශ තුනක් සඳහන් කරන්න.

(iii) දේව වචනය පාසල තුළ බෙදාගැනීම සඳහා කළ හැකි ක්‍රියාකාරකම් පහක් ලියන්න.

(ලකුණු $2 + 3 + 5 = 10$)

03. (i) පාවුළුතුමා විසින් සංදේශ යවන ලද කණ්ඩායම් දෙකක් නම් කරන්න.

(ii) පාවුළු ලිපි අතර ඇති ආරූඪ කර්තෘත්වයෙන් ලියූ හසුන් පත් තුනක් දක්වන්න.

(iii) විජාතීන්ගේ අපෝස්තුළුවරයා ලෙස සභාවට මහඟු සේවාවක් කළ ශුද්ධවූ පාවුළුතුමාගෙන් වත්මන් ධර්මදූතයන්ට ලැබෙන මඟපෙන්වීම් පහක් පෙන්වා දෙන්න.

(ලකුණු $2 + 3 + 5 = 10$)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

04. (i) ජොහාන් ශුභාරංචියේ සංකේතය හා එම සුභාරංචියට භාවිත වන වෙනත් නමක් ලියන්න.

(ii) මතෙව්, මාක්, ලූක් ශුභාරංචිවල පරමාර්ථ පිළිවෙළින් ලියා දක්වන්න.

(iii) ශුභාරංචි අධ්‍යයනය කිරීමෙන් ඔබේ ජීවිතයට ළඟා කර ගත හැකි යහපත් ආකල්ප ක්‍රියාවට නංවන ආකාර පහක් විස්තර කරන්න.

(ලකුණු $2 + 3 + 5 = 10$)

05. (i) ක්‍රිස්තුස් වහන්සේගේ කන්ද උඩ දේශනාවේ ඇතුළත් ඉගැන්වීම් දෙකක් ලියන්න.

(ii) සැත්තෑ දෙනා ධර්මදූත මෙහෙයට යැවීමේදී ජේසුස් වහන්සේ ඔවුන්ට දුන් උපදෙස් තුනක් පෙන්වා දෙන්න.

(iii) භාග්‍ය අට තුළින් පෙන්වා දෙන දේව රාජ්‍යයේ වටිනාකම් අත්කර ගැනීමට ඔබට කළ හැකි ක්‍රියා පහක් ලියන්න.

(ලකුණු $2 + 3 + 5 = 10$)

06. (i) තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරයේ 'ස' යනු සතේ සමාජය තුළ ක්‍රියාත්මක වන ගුණාංග දෙකක් ලියන්න.

(ii) පොදු පූජකවරය ලැබූ විශ්වාසිකයින්ට පැවරෙන ත්‍රිවිධ කාර්යයන් මොනවා ද?

(iii) යහපත් සාමකාමී පාසල් සමාජයක් ගොඩනැංවීම සඳහා ඔබේ පන්තියේ සාමාජිකයන් සමග දායක විය හැකි ආකාර පහක් විස්තර කරන්න.

(ලකුණු $2 + 3 + 5 = 10$)

07. මින් ඔබ කැමති මාතෘකා දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) සිරිලක් කිතු සසුන බැබළ වූ ගෞරවනීය ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා

(ii) සත්‍යය අගයමු. ඒ තුළ ජීවත් වෙමු.

(iii) ඊශ්‍රායෙල් ජන නායක මෝසෙස්තුමා

(iv) මනහර පරිසරය සුරකිමු.

(ලකුණු $2 + 3 + 5 = 10$)

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 3 ) | 02. ( 2 ) | 03. ( 4 ) | 04. ( 2 ) | 05. ( 1 ) | 06. ( 4 ) | 07. ( 2 ) | 08. ( 4 ) | 09. ( 1 ) | 10. ( 4 ) |
| 11. ( 2 ) | 12. ( 1 ) | 13. ( 3 ) | 14. ( 4 ) | 15. ( 1 ) | 16. ( 2 ) | 17. ( 3 ) | 18. ( 4 ) | 19. ( 2 ) | 20. ( 3 ) |
| 21. ( 3 ) | 22. ( 3 ) | 23. ( 4 ) | 24. ( 4 ) | 25. ( 1 ) | 26. ( 2 ) | 27. ( 1 ) | 28. ( 2 ) | 29. ( 1 ) | 30. ( 2 ) |
| 31. ( 4 ) | 32. ( 1 ) | 33. ( 3 ) | 34. ( 4 ) | 35. ( 1 ) | 36. ( 3 ) | 37. ( 2 ) | 38. ( 3 ) | 39. ( 3 ) | 40. ( 2 ) |

(ලකුණු 40)

## II පත්‍රය

01. (i) I, II පේදුරු / I, II, III ජොහාන් / හෙබ්‍රෙව් / ජාකොබ් / ජූද්
(ii) අපෝස්තුළුවරු, උපස්ථායකයන්
(iii) වීර සෙබළා, සත්‍යය
(iv) 7 වැනි පණත - සොරකම් නොකරන්න. / 10 වැනි පණත - අන් වස්තු ආශා නොකරන්න.
(v) ජනතාව, වැටුපක් නොලබා කරන සේවය
(vi) තෝබිත්, ජුදිත්, ප්‍රඥාව, සිරාක්, බාරුක්, I, II මකබි
(vii) විශාල ජනතාවක්, ජනතාවට දේශයක්
(viii) කීකරුකම, පූජක බඹසර
(ix) බෙනඩික්තුමා, පැකෝමියස්තුමා
(x) සෙකරියස්තුමාගේ ප්‍රශංසා ගීය / මරියතුමියගේ උදාන ගීය / සිමියොන්තුමාගේ ප්‍රශංසා ගීය

02. (i) පංච පුස්තකය, දිවැසි පොත්
(ii) ජෙරුසලම ජූදයාව, සමාරිය
(iii)
* උදෑසන යාච්ඤාව අවස්ථාවේ දේව වචනය ප්‍රකාශ කිරීම.
* දේව වචනය අඩංගු ශුද්ධවූ ලියැවිලි පාඨ පන්ති කාමරවල ප්‍රදර්ශනය කිරීම.
* දේව වචනය ලියූ පුවරු පාසල් භූමිය තුළ නෙත ගැටීමට සැළැස්වීම.
* දැන්වීම් පුවරුවෙහි දවසට අදාළ ශුද්ධවූ ලියැවිලි පාඨය ඇතුළත් කිරීම.
* සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ දේව වචනය බෙදාගැනීම.

03. (i) කිතුණු සංඝ, පුද්ගලයන්
(ii) I තිමති / II තිමති / තීතස්
(iii)
* තමා සතු හැකියා, කුසලතා සහ ශක්තීන් යොදාගනිමින් ඵලබර දහම් සේවයක යෙදීම.
* කරදර හිරිහැර පීඩා තුළ වුවද දිව්‍ය සංරක්ෂණය කෙරෙහි විශ්වාසය තබමින් දූත කාර්යයෙහි යෙදීම.
* සිය අභිමතයට අනුව නොව නිරන්තරයෙන් ශුද්ධාත්ම මඟපෙන්වීමට අවනතව ක්‍රියා කිරීම.
* කිතුණු ඇදහිල්ල හා කිතුණු යුතුකම් පිළිබඳව දැනුවත් කිරීම සඳහා ජීවිත ආදර්ශය ද යොදා ගැනීම.
* පවතින සමාජ වටපිටාව තුළ ජනතා අවශ්‍යතා පිළිබඳව ද සැළකිලිමත් වෙමින් කාලීන දහම් සේවාවක නිරත වීම.

04. (i) රාජාලියා / ආධ්‍යාත්මික සුභාරංචිය
(ii) මතෙව් - ජේසුස් වහන්සේ නව මෝසෙස්තුමා සහ නව මෙසියානික ගුරුවරයා බව පෙන්වීම.
මාක් - නීරෝ අධිරාජයාගේ පීඩනයට ලක් වූ කිතුණුවන් දිරිමත් කිරීම.
ලූක් - ජේසුස් වහන්සේ ජුදා ජාතිකයන්ගේ පමණක් නොව මුළු ලෝකවාසීන්ගේම ගැළවුම්කරුවාණන් බව සනාථ කිරීම.
(iii)
* දේව රාජ්‍යයේ වටිනාකම් හඳුනාගෙන ඒ තුළ ජීවත් වීම.
* සමාව දීමේ හා සාධාරණත්වයේ සමාජයක් ගොඩනැංවීම.
* සත්‍ය විශ්වාසය තුළ අවංක ජීවිතයක් ගතකිරීම හා ඊට මඟපෙන්වීම.
* අසරණ වූවන්ට සරණවීමට ඉදිරිපත් වීම.

05. (i) භාග්‍ය අට, පොළොවේ ලුණු, යාච්ඤාව ........... (කන්ද උඩ දේශනයේ ඕනෑම ඉගැන්වීම් 2 ක්)
(ii)
* පසුම්බියක් හෝ මල්ලක් හෝ පාවහන් හෝ රැගෙන නොයන්න.
* යම් ගෙදරකට ඇතුළු වූ කල සාමය පැතීම.
* දේව රාජ්‍යය උදා වූ බව ප්‍රකාශ කිරීම.

(iii)
* සියල්ලේ දී දෙවියන් මත රැඳෙමින් දෙව් සරණ ලබමින් දිවි ගෙවීම.
* නිහතමානී ගති පැවතුම් සහිත බැහැපත් චාම් ජීවිතයක් ගත කිරීම.
* යුක්තියට සාපිපාස වෙමින් යුක්තිගරුකව ක්‍රියා කිරීම.
* නිර්මල සිතින් යහපත් දිවියක් ගතකිරීම.
* සාමය ඇති කිරීමට කටයුතු කරමින් බෙදීම් වලින් තොර සමාජයක් බිහි කිරීමට දායක වීම.

06. (i) සදහම් බව, සබැඳියාව, සාමය, සහෝදරත්වය, සත්‍යය, සමානාත්මතාව, සාධාරණත්වය
(ii) ඒඬේරික, පූජක, දිවැසි
(iii)
* පාසලේ නීති-රීති පිළිපදිමින් පොදුවේ පාසලේ ගෞරවය උදෙසා කටයුතු කිරීම.
* පිරිසිදු කිරීම් ඇතුළු පොදු වැඩ කටයුතු සාමූහිකව ඉටුකිරීමට දායක වීම.
* බෙදාහදා ගැනීම තුළ සහෝදරත්වයේ සමාජයක් ගොඩනැංවීම.
* එකිනෙකාට ගරු කරමින් අන් මත ඉවසමින් ක්‍රිස්තු ආකල්ප ගොඩනැංවීම.
* යහපත් ගුරු සිසු සබඳතා තුළ ප්‍රියමනාප ඉගෙනුම් වටපිටාවක් නිර්මාණය කිරීමට ක්‍රියා කිරීම.

07. සිසුවා ලියා ඇති කරුණු සළකා බලා ලකුණු ප්‍රදානය කරන්න.